අධ්‍යක්ෂ- සැපයුම්
Director/Supplies
Telephone No : 011-2399141
Fax : 011-2320729
Extension : 3015
E-Mail : dir.supplies@police.lk
සහකාර පොලිස් අධිකාරි- සැපයුම්
ASP/Supplies
Tele/Fax : 011-2324915
Extension : 3110
ස්ථානාධිපති- සැපයුම්
OIC/Supplies
Tele/Fax : 011-2543012
Extension : 3111

# පොලිස් සැපයුම් කොට්ඨාශය
பொலிஸ் விநியோகப் பிரிவு
POLICE SUPPLIES DIVISION

පොලිස් මූලස්ථානය, දෙවන මහල, කොළඹ 01, ශ්‍රී ලංකා.
பொலிஸ் தலைமை அலுவலகம், 2 டாம் மாடி கொழும்பு 01, இலங்கை.
POLICE HEADQUARTERS, 2nd FLOOR, COLOMBO 01, SRI LANKA.

මගේ අංකය My No D/SUP/OUT/6766 2022
ඔබේ අංකය Your No }
ගණකාධිකාරි- සැපයුම්
Accountant/Supplies
Tele/Fax : 011-2324729
Extension : 3113
ප්‍රධාන කළමණාකරණ සහකාර
Chief Management Asst:
Extension : 3118
General No: 011-2421111

2022.09.08

අධ්‍යක්ෂ ජනරාල්,
තොරතුරු දැනගැනීම හා අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව,
කාමර අංක : 203 – 204,
බණ්ඩාරණායක ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**<u>අභියාචනා අංක 927/2022, 928/2022 සහ 929/2022 සඳහා තොරතුරු ලබාදීම</u>**

සමාජය හා සාමයික කේන්ද්‍රයේ තරිඳු ජයවර්ධන මහතා විසින් ශ්‍රී ලංකා පොලිසියට කඳුළු වායු මිලදී ගැනීම සම්බන්ධයෙන් ඉල්ලුම් කරන ලද තොරතුරු ලබා නොදීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත කර ඇති උක්ත අභියාචනා විභාග කිරීම 2022.09.01 දින සිදුකල අතර, එහිදී දෙපාර්ශවයේ එකඟතාවය මත කොමිෂන් සභාවේ නියමය පරිදි පහත සඳහන් තොරතුරු ලබාදෙන ලෙසට දන්වා ඇත.

**<u>2010 ජනවාරි 01 වන දින සිට 2022 ජනවාරි 01 වන දින දක්වා කාලය තුළ.</u>**

1) ලංකාවට ගෙන්වා ඇති කඳුළු ගැස් ප්‍රමාණය කොපමණද?
පොලිස් සැපයුම් කොට්ඨාශය මගින් කඳුළු වායු උණ්ඩ 25,000 ප්‍රමාණයක් ගෙන්වා ඇත.

2) ලංකාවට අවස්ථා කීයකදී කඳුළු ගැස් ගෙන්වා තිබේද?
පොලිස් සැපයුම් කොට්ඨාශය මගින් කඳුළු වායු උණ්ඩ අවස්ථා 03 කදී ගෙන්වා ඇත.

4) එක් එක් අවස්ථාවේදී වියදම් වූ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන්ව කොපමණද?
පොලිස් සැපයුම් කොට්ඨාශය මගින් මිලදී ගත් කඳුළු වායු උණ්ඩ සඳහා පහත පරිදි මුදල් වැයකර ඇත.

i. 2017 වර්ෂයේ කඳුළු වායු උණ්ඩ 5,000 ප්‍රමාණය සඳහා- රු. 10,809,814.00
ii. 2019 වර්ෂයේ කඳුළු වායු උණ්ඩ 15,000 ප්‍රමාණය සඳහා- රු. 39,399,006.84
iii. 2020 වර්ෂයේ කඳුළු වායු උණ්ඩ 5,000 ප්‍රමාණය සඳහා- රු. 50,812,310.82

5) එලෙස කඳුළු ගෑස් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදුන් ලේඛන මොනවාද?
එලෙස කඳුළු ගෑස් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවූ ලේඛන වල සහතික පිටපත් ලබාදෙන්න.

i. 2017 වර්ෂයේ LA/S1/FFHQ/01/2016 ගොනුව යටතේ 5,000 ප්‍රමාණයක්
ii. 2019 වර්ෂයේ LA/S1/FFHQ/02/2019 ගොනුව යටතේ 15,000 ප්‍රමාණයක්
iii. 2019 වර්ෂයේ LA/S1/FFHQ/13/2019 ගොනුව යටතේ 5,000 ප්‍රමාණයක්

ඉහත මිල ගණන් කැඳවූ ලේඛන වල සහතික පිටපත් **"ඇමුණුම 01"** ලෙස මෙයට යාකර ඇත.

6) එම සෑම අවස්ථාවකටම අදාල තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා වල සහතික පිටපත් ලබාදෙන්න.

තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා වල සහතික පිටපත් **"ඇමුණුම 02"** ලෙස මෙයට යාකර ඇත.

7) එම සෑම අවස්ථාවකටම අදාල ටෙන්ඩර් ප්‍රධානය කල ලිපිවල සහතික පිටපත් ලබාදෙන්න.
ටෙන්ඩර් ප්‍රධානය කල ලිපිවල සහතික පිටපත් **"ඇමුණුම 03"** ලෙස මෙයට යාකර ඇත.

**08,09,10,11,12,13 සහ 14 ට අදාල තොරතුරු ලබාදීම සම්බන්ධව පොදු අධිකාරියේ ස්ථාවරය**

පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය මගින් කඳුළු වායු උණ්ඩ පිළිබඳව සිදුකරන ලද ඉල්ලීමට අනුව සැපයුම් කොට්ඨාශය විසින් අදාල ප්‍රසම්පාදන කටයුතු සිදුකර, එම ඉල්ලීමට අදාල භාණ්ඩ එම කොට්ඨාශය වෙත නිකුත් කිරීමට කටයුතු කර ඇත. එම උණ්ඩ අවශ්‍ය පරිදි දිවයිනේ පොලිස් කොට්ඨාශ වෙත බෙදා හැරීම හා ඊට අදාල ලේඛන පවත්වාගෙන යාම පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය විසින් සිදුකරනු ලබයි.

ඉහත කොමිෂන් සභාවේ නියමය පරිදි ඉල්ලා ඇති තොරතුරු වලට අනුව ඉහත සඳහන් කර ඇති කාල සීමාව තුලදී කඳුළු ගෑස් වාර්ෂිකව භාවිතා කල ප්‍රමාණය හා එම කඳුළු ගෑස් බෙදා හැරීමේ කටයුතු සම්බන්ධ ලේඛන සැපයුම් කොට්ඨාශය සතුව නොමැත.

එබැවින් ප්‍රශ්ණ අංක 08 සිට 14 දක්වා කරුණු වලට පිළිතුරු සැපයීම සඳහා විස්තර සැපයුම් කොට්ඨාශය සතුව නොමැති බැවින්, එය පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ තොරතුරු නිලධාරියාගෙන් ලබා ගැනීම සුදුසු බව නිරීක්ෂණය වේ.

ජේ.පී.ඩී. ජයසිංහ
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
අධ්‍යක්ෂ / සැපයුම්
පොලිස් මූලස්ථානය
කොළඹ 01.

අධ්‍යක්ෂ/ සැපයුම්

පිටපත - තරිඳු ජයවර්ධන මහතා - සමාජය හා සාමයික කේන්ද්‍රය, නො.281, ඩීන්ස් පාර, කොළඹ 10.

ගොනුවට

DISUP/OUT/6766/22

ජේ.පී.ඩී. ජයසිංහ
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
අධ්‍යක්ෂ / සැපයුම්
පොලිස් මූලස්ථානය
කොළඹ 01.

ශිරිඳු ජයවර්ධන මහතා,
සමාජය හා සාමයික කේන්ද්‍රය,
නො. 281,
ඩීන්ස් පාර,
කොළඹ 10.